# 2023 වර්ෂයට භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම

## පළාත් මහ රෝහල - බදුල්ල

බදුල්ල පළාත් මහ රෝහලට, 2023 වර්ෂය වෙනුවෙන් පහත දැක්වෙන අයිතමයන් යටතේ භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනීමට සුදුසුකම් සපුරා ඇති රජයේ ආයතන, පුද්ගලික ආයතන, සමිති හා පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවන බව මෙයින් දන්වා සිටිමි.

01 සියලුම අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරේ **"2023 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම"** යනුවෙන් සඳහන් කල යුතු අතර, ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් 2022-12-08 දින ප:ව 2.30 ට හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, ඒ සඳහා ගෙවන ලද ලියාපදිංචි ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

02. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ කොන්දේසි www.badullapgh.org වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය. වැඩි විස්තර 055-2222261/62(ex 1113) අමතා ලබා ගත හැක.

| අයිතම අංකය | 1. **භාණ්ඩ සැපයීම** | අයිතම අංකය | **2. සේවා සැපයුම්** |
|---|---|---|---|
| 1 | ලිපි ද්‍රව්‍ය | 01 | ගොඩනැගිලි නඩත්තු කටයුතු (ICTAD ලියාපදිංචි වී සිටිය යුතුය) |
| 2 | පරිගණක/ජායා පිටපත් යන්ත්‍ර රිබන් වර්ග/ටෝනර්/ කාට්‍රිජ් | 02 | වාහන අළුත්වැඩියාවන් |
| 3 | ලිපි ද්‍රව්‍ය නොවන අනෙකුත් පාරිභෝජ්‍ය ගබඩා ද්‍රව්‍ය (සබන්, බැටරි වර්ග, ඉදල්, කොසු, විෂ බීජ නාශක වැනි) | 03 | පරිගණක හා පරිගණක මුද්‍රණ යන්ත්‍ර අළුත්වැඩියාවන් |
| 4 | රෙදිපිළි වර්ග සැපයීම | 04 | විදුලි උපකරණ හා විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් උපකරණ අළුත්වැඩියාවන් |
| 5 | කාර්යාල උපකරණ (ජායාපිටපත් යන්ත්‍ර, අනු පිටපත් යන්ත්‍ර, ගණක යන්ත්‍ර වැනි) | 05 | ගෑස් ලිප් හා ගෑස් උපකරණ අළුත්වැඩියාව හා සේවා කිරීම |
| 6 | ගෘහභාණ්ඩ (දැව/වානේ) වර්ග (මේස, පුටු, කබඩ්, ලිපිගොණු කබඩ්/ප්ලාස්ටික්/ෆයිබර් වැනි) | 06 | ඇළුමිනියම් උපකරණ හා පිත්තල උපකරණ අළුත්වැඩියාවන් |
| 7 | රෝහල් ගෘහ භාණ්ඩ වර්ග (රෝහල් ඇඳන්,සේලයින් ස්ටෑන්ඩ්,රෝහල් ස්ටූල වැනි) | 07 | තිරරෙදි ,දොරරෙදි, ජනෙල් රෙදි සපයා සවිකිරීම |
| 8 | බෙහෙත් කවර/ X- Ray කවර / CT/MRI කවර | 08 | රබර් මුද්‍රා සෑදීම |
| 9 | මෙට්ට වර්ග රෙක්ෂින් කල/ නොකල(රෙක්ෂින්,කුෂන්,රබර් මිශ්‍රිත කොහු මෙට්ට වැනි) | 09 | වායු සමීකරණ යන්ත්‍ර / මධ්‍යම වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියාව |
| 10 | පරිගණක හා පරිගණක උපාංග | 10 | ජායා පිටපත් යන්ත්‍ර,ඩුප්ලෝ මැෂින් හා රෝනියෝ මැෂින් අළුත්වැඩියාව |
| 11 | ටයර්, ටියුබ්, රිම්, අලෝවිල් | 11 | ජල හා පල්දෝරු පොම්ප අළුත්වැඩියාවන් |
| 12 | වාහන බැටරි | 12 | යකඩ හා වානේ පෑස්සුම් වැඩ |
| 13 | වාහන අමතර කොටස් හා උපාංග | 13 | පොත්පත්, ලිපි, ස්ටිකර්, බැනර්, නාම පුවරු හා ආකෘතිපත්‍ර මුද්‍රණය |
| 14 | ගොඩනැගිලි ද්‍රව්‍ය,ජල නල හා උපාංග සහ විදුලි උපාංග | 14 | රාජකාරි හැඳුනුම්පත් සකස් කරවා ගැනීම |
| 15 | විද්‍යුත් උපකරණ සහ යාන්ත්‍රික උපකරණ / ඉලෙක්ට්‍රොනික් | 15 | කුෂන් කිරීම (,පුටු,සෝෆා යනාදිය) |
| 16 | ඖෂධ වර්ග | 16 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ අළුත්වැඩියාව |
| 17 | රෝහල් වෛද්‍ය/ශල්‍ය උපකරණ හා උපාංග | 17 | වාහන සේවා කිරීම |
| 18 | රෝහල් රසායනාගාර උපකරණ හා උපාංග | 18 | ඉන්ධන සැපයීම ( ඩීසල්,පැට්‍රොල්,පෙට්‍රෝලියම් නිෂ්පාදන ) |
| 19 | රෝහල් රසායනාගාර උපකරණවලට අවශ්‍ය පාරිභෝජ්‍ය ද්‍රව්‍ය(Reagents) | 19 | LP ගෑස්/ ආගන් සැපයීම |
| 20 | විකලාංග උපකරණ සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය | 20 | ජිවිත ආරක්ෂිත උපකරණ හා ටී ෂර්ට් මුද්‍රණය කිරීම |
| 21 | ලී, ලෑලි හා දැව සැපයීම | 21 | CCTV/ ඩ්‍රෝණ කැමරා/අන්තර්ජාල සැපයුම් / පරිගණක මෘදුකාංග |
| 22 | සුදු යකඩෙන් නිමවන ලද භාණ්ඩ සැපයීම | 22 | වායු සමීකරණ යන්ත්‍ර / මධ්‍යම වායු සමීකරණ පද්ධතිය නඩත්තු හා සේවා කිරීම |
| 23 | ගාබේජ් බෑග් (කහ,කළු හා කොළ වර්ණයන්) | 23 | කුලී පදනම මත වාහන සැපයීම |
| 24 | සියලුම වර්ගයේ පාවහන් | 24 | පුහුණු වැඩසටහන් ( සේවක අභිප්‍රේරණ වැඩසටහන්/බැහැර ගත ක්‍රියාශිලි අභ්‍යාස වැඩසටහන් සහ වෙනත්) |
| 25 | වායු සමීකරණ යන්ත්‍ර | 25 | ඉවතලන ද්‍රව්‍ය විකිණීම |
| 26 | ෆෑන් වර්ග (සිවිලිම් ෆෑන්, වෝල් ෆෑන් ආදිය) | 26 | හිමිකම් නොපාන මළ සිරුරු හා ශරීර අවයව කොටස් මිහිදන් කිරීම |
| | | 27 | අනතුරුදායික ගස් කපා ඉවත් කිරීම |
| | | 28 | රථ වාහන දුම් පරික්ෂණ වාර්තා ලබා ගැනීම |
| | | 29 | රසායනාගාර සේවා |
| | | 30 | වීල් එලයිමන්ට් |
| | | 31 | විදුලි ජනක යන්ත්‍ර කුලී පදනම මත සැපයීම/විදුලි ජනක යන්ත්‍ර නඩත්තු හා සේවා කිරීම |
| | | 32 | උත්සව/පුහුණු වැඩසටහන් සඳහා ආහාර පාන සැපයීම |
| | | 33 | වාහන වායු සමීකරණය කිරීම |
| | | 34 | ශිතකරණ/රෙදි සේදීමේ යන්ත්‍ර අළුත්වැඩියාවන් හා සේවා කිරීම |
| | | 35 | වාහන කුෂන් කිරීම |
| | | 36 | පස්, කළුගල්,මැටල්,වැලි සැපයීම |
| | | 37 | සිමෙන්ති හා කොන්ක්‍රීට් ආශ්‍රිත නිෂ්පාදන |
| | | 38 | මල් පෝච්චි,මල් පැල වර්ග,උද්‍යාන අලංකාර ද්‍රව්‍ය |
| | | 39 | දර සැපයීම |

**<u>ලියාපදිංචි කර ගැනිමේ පොදු කොන්දේසි</u>**

01. ලියාපදිංචිවීමට අපේක්ෂා කරනු ලබන සැපයුම්කරුවන් විසින් ඔබගේ විස්තර සමඟ ලියාපදිංචිවීමට අපේක්ෂා කරනු ලබන එක් එක් අයිතමය වෙනුවෙන් පහත සඳහන් ආකෘතියට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක සකසා ගත් අයදුම්පතෙහි ලියාපදිංචි වන අයිතමය හා **අයිතමයේ අංකය** නිවැරදිව සඳහන් කර ඉදිරිපත් කල යුතුය.

02. සම්පූර්ණ කරන ලද අයදුම්පත් එක් අයිතමයකට රු:- 1000.00ක ලියාපදිංචි ගාස්තුද, සමඟ සභාපති, ප්‍රාදේශිය ප්‍රසම්පාදන කමිටුව, පළාත් මහ රෝහල, බදුල්ල. යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම කල හැක. ලියාපදිංචි ගාස්තු බැංකුව වෙත බැර කරන්නනේනම් ලංකා බැංකුවේ අධ්‍යක්ෂ පළාත් මහ රෝහල, බදුල්ල යන 7040186 ගිණුම් අංකයට බැර කර ඊට අදාල මුදල් ගෙවීමේ කුවිතාන්සිය, අයදුම්පත සමඟ එවිය යුතුය. මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

03. ලියාපදිංචි වන සැපයුම් / සේවා ආයතන ව්‍යපාර ලියාපදිංචි සහතිකයේ හා වැට් බදු සඳහා ලියාපදිංචි වී ඇත්නම් එම සහතික කල පිටපත් ද,

1 ඔබ කිසියම් නිෂ්පාදකයෙකු හෝ විදේශිය නිෂ්පාදන ආයතනයක බලයලත් එකම නියෝජිත ආයතනය වන්නේ නම්, නිෂ්පාදන ආයතනය හෝ එකම නියෝජිත ආයතනය බව සනාථ කරන සහතික කල පිටපතක්

11 ආවරණය වන බල ප්‍රදේශය (මුළු ලංකාවටමද නැතිනම් විශේෂිත කළාපයකට ද යන වග, ඇතුළත් සහතිකයේ ජායා පිටපතක්)

III ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් සඳහා ICTAD ලියාපදිංචි සහතිකය අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.

04. සියලුම අයදුම්කරුවන්ගේ සුදුසුකම් පරික්ෂා කිරීමෙන් පසු ලියාපදිංචි කරගනු ලැබේ.

05. භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් සඳහන් කරන ලිපිනයේ ස්ථිරවම ව්‍යාපාරය පවත්වාගෙන යා යුතු අතර සියලුම කටයුතු සිදු කරනු ලබන්නේ අයදුම්පතේ සඳහන් ස්ථිර ලිපිනය සඳහා පමණි. ලිපිනයෙහි වෙනස් වීමක් සිදු වුවහොත්, වහාම නව ලිපිනය දැන්විය යුතුය. එසේ නොවන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමේ බලය බදුල්ල පළාත් මහ රෝහලේ අධ්‍යක්ෂ සතුවේ.

06. සියලුම සැපයුම්කරුවන්ගෙන් හෝ තෝරා ගත් සැපයුම්කරුවන් 05 දෙනෙකුගෙන් පමණක් හෝ එක් වරකදි මිළ ගණන් කැඳවීමට අධ්‍යක්ෂ වෙත බලතල ඇත්තේය. ප්‍රමාණවත් සැපයුම්කරුවන් නොමැති අවස්ථාවලදි අවශ්‍යතාවය මත බාහිර සැපයුම්කරුවන්ගෙන් මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට හා සේවා ලබා ගැනීමටද අධ්‍යක්ෂ වෙත බලතල ඇත්තේය.

07. අසාධු ලේඛණයට ඇතුලත් වූ කිසිදු භාණ්ඩ හා සේවා සැපයුම්කරුවකු ලියාපදිංචි කරගනු නොලැබේ.

08. මිළ ගණන් ඉදිරිපත් කිරීමේදී සියලු මිළ ගණන් ඉදිරිපත් කල යුත්තේ අදාල සැපයුම් බදුල්ල පළාත් මහ රෝහල වෙත ගෙනවිත් භාරදීම සඳහා වන අතර, එම මිළ ගණන් ඉදිරි මාස තුනකටවත් (03)වලංගු විය යුතුය. ඇණවුම අනුව සැපයීමට නියමිත දින රෝහල වෙත අදාළ භාණ්ඩ හෝ සේවා සපයනු නොලබීම , එම ඇණවුම අවලංගු කිරීමට හේතුවක් වන අතර, එසේ සැපයීම් ප්‍රතික්ෂේප කරන සැපයුම්කරුවන්ගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබේ. එසේම, යම් අයිතමයක සාම්පල පරීක්ෂා කිරීමට තිරණය කළහොත්, අදාල සාම්පල නියමිත දිනට රෝහල වෙත ගෙනවිත් ඉදිරිපත් කළ යුතුය.

09. මිළ ගණන් කැඳවීමේදී පිට පිටම අවස්ථා 03ක් මිළ ගණන් ඉදිරිපත් නොකරන ආයතනයන්ගෙන් නැවත මිළ ගණන් කැඳවනු නොලැබේ.

10. ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීමේදී රු: 200,000.00 ක වාණිජ බැංකුවකින්/ රක්ෂණ සමාගමකින් ලබා ගත් කාර්ය සාධන ඇපකරයක් හෝ මුදලින් රෝහල වෙත තැන්පතු කළ යුතු වන අතර, ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත් ගිවිසුමකටද එළඹිය යුතුය.

11. 2022 වර්ෂයේ සැපයුම් අසතුටුදායක සැපයුම්කරුවන් ලියාපදිංචි කරගනු නොලැබේ.

13. සැපයුම්කරුවන් ලියාපදිංචි කර ගැනිමේ අවසාන තිරණය බදුල්ල පළාත් මහ රෝහල් අධ්‍යක්ෂ සතු වන්නේය.

අධ්‍යක්ෂ,<br>
පළාත් මහ රෝහල,<br>
බදුල්ල.

අයදුම්පත්‍රයේ ආකෘතිය පහත පරිදි වේ.

**2023 වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ අයදුම්පත**

**පළාත් මහ රෝහල, බදුල්ල.**

| **අයදුම්පත් අංකය :-** | |
|---|---|

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

01. ලියාපදිංචි වන භාණ්ඩ / සේවා සැපයුම :- ........................................................ .... .... . .... ......

(ශල්‍ය උපාංග හා රසායනාගාර ප්‍රතික්‍රියක ..................................................... .... .... .... ...........

සඳහා ලියාපදිංචි වන ආයතන සපයන උපාංග පිළිබඳ විස්තර ඇමුණුම් ඉදිරිපත් කල යුතුය)

අයිතම අංකය :- ......................................... .............. .... .... ... ... ....

02. ලියාපදිංචි වන ආයතනයේ නම හා ලිපිනය:- .............................................. .... .... ........... ... ... ......

.............................................. .... .... .............. ... ... .......

........................................................................ .... ... ... ... ... .... ...

03. I. දුරකථන අංකයන් :- ............................................................ .... ... ... ....... ...

II. ෆැක්ස් අංකයන් :- ............................................................ .... . ... ... ...... ...

III. විද්‍යුත් තැපැල් ලිපිනය :- ............................................................ .... ... ... ... .... ...

04. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ අංකය:-............................................................ .... .... . ... ... ... ...

05. ණයට දිය හැකි කාල සීමාවන් :-............................................................ .... .... . ... ... ... ...

06. වැට් බදු අංකය :-............................................................ .... .... . ... ... ... ...

07. ICTAD ලියාපදිංචි අංකය හා ශ්‍රේණිය :-............................................................ .... .... . ... ... ... (ගොඩනැගිලි නඩත්තු කොන්ත්‍රාත්කරුවන් සඳහා පමණි.)

08. රජයේ ආයතන වලට සැපයීම් පිළිබඳ විස්තර :-............................................................ .... .... ... ...

09. ලබාගත් කුවිතාන්සි අංකය :- ............................................................ ... ... ... ..

10. ඔබ කිසියම් නිෂ්පාදකයකු / විදේශීය නිෂ්පාදන ආයතනයක බලයලත් එකම නියෝජිත ආයතනය නම්,

I. නිෂ්පාදන ආයතනය හෝ එකම නියෝජිත ආයතනයද යන වග :-.............................................

.............................................................................................................................. ... ... ........

II. ආවරණය වන බල ප්‍රදේශය :-.........................................................................................

........................................................................................................................... ... ... ..........

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත්, අසාධු ලේඛනවලට මගේ ආයතනයේ නම ඇතුලත් වී නොමැති බවටත්, මෙයින් සහතික වන අතර ලබා දෙන භාණ්ඩ ඇණවුම් නියමිත කාල සීමාව තුල රෝහල වෙත ගෙනවිත් භාර දෙනු ලබන බවත්, සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාල අනෙකුත් කොන්දේසි වලට එකඟ වන බවත්, දන්වා සිටිමි. එමෙන්ම, 2023 වර්ෂය සඳහා ලියාපදිංචි සැපයුම්කරුවකු වශයෙන්, මාගේ ආයතනය ද ලියාපදිංචි කරදෙන මෙන් කරුණිකව ඉල්ලා සිටිමි.

...............................

අයදුම්කරුගේ අත්සන

දිනය :- 2022- -

නම :- .........................................